පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

பாராளுமன்றத்தின் அரசாங்கக்கட்சி முதற்கோலாசான் அலுவலகம்

பாராளுமன்றத்தின் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் அது தொடர்பாக மேற்கொண்ட நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No. : 79

Office of the Chief Government Whip of Parliament

Submission of observations of the Hon. Minister in charge of the Institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය
பாராளுமன்ற அரசாங்கக்கட்சி முதற்கோலாசான் அலுவலகம்
Office of the Chief Government Whip of Parliament

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධ නිරීක්ෂණ හා ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
මු.රෙ. 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රුස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ ආරම්භයේ දී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොමැති අතර, 2023 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා එතැන් සිට නිසි පරිදි වර්ෂය ආරම්භයේ දී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර, කටයුතු කරමින් පවතී.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කරගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය වෙනම වැය ශීර්ෂයක් යටතේ ක්‍රියාත්මක වුවද, මෙම කාර්යාලයේ කටයුතු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා ඒකාබද්ධව සිදු කරනු ලැබේ. මෙම කාර්යාලයෙන් සිදු කරනුයේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කිරීම වන අතර, එකී සියළුම මන්ත්‍රීවරුන්ගේ තොරතුරු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. එබැවින් වෙනමම වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් මේ දක්වා පැන නැඟී නොමැති වුවද, ඉදිරියේදී පැන නඟින අවශ්‍යතාවයන් මත වෙනමම වෙබ් අඩවියක් පවත්වාගෙන යාම පිළිබඳව අවධානය යොමු කර ඇත. ඉදිරි වර්ෂයේ කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. මෙම කාර්යාලය මඟින් රජයේ සියළුම අමාත්‍යාංශයන්හි තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අණ පනත් නීතිරීති සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දීමට කටයුතු කරනු ලබයි. එ අනුව මෙම කාර්යාලය මඟින් රජයේ සියලුම තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය ලබා දෙමින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ඇත.

එම්. ඩබ්ලිව්. ජගත් කුමාර
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්

2024.08. 22